# ශ්‍රී ලංකාවේ මරුවැල් පන්න ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය පුවත් හසුන අංක 1

*ශ්‍රී ලංකාවේ මරුවැල් පන්න ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ නව ව්‍යාපෘතියක් මුහුදු ආහාර අපනයනකරුවන්ගේ සංගමයේ සභාපති ප්‍රභාෂ් සුබසිංහ මහතා අතින් 2017 වර්ෂයේ අප්‍රේල් මස බ්‍රසල්ස් නුවර (බෙල්ජියම) සී ෆුඩ් එක්ස්පෝ ග්ලෝබල් හිදී දියත් කරන ලදී .මීට අදාළව ශ්‍රී ලංකා මුහුදු ආහාර අපනයනකරුවන්ගේ සංගමය (SEASL) විසින් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය ,ගරු අමරවීර මැතිතුමා (දකුණු පස)සමඟ ශ්‍රී ලංකාවේ මරුවැල් පන්න ධීවර කර්මාන්තයේ ජෛව විද්‍යාත්මක සහ පරිසර විද්‍යාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් මැයි මස අත්සන් කෙරිණි.* එමෙන්ම මෙම අවබෝධතා ගිවිසුම මගින් තිරසාර ලෙස කළමනාකරණය කරන ලද ධීවර කර්මාන්තයක් සඳහා අවෂ්‍ය විශේෂිත කළමනාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට අදාළ පාර්ශවයන්ට පවරා දී ඇත.ඒ අනුව ජූලි මස නව ව්‍යාපෘතියෙහි, පරිපාලන, කළමනාකරණ, සැළසුම් නිර්මාණය, සැළසුම් පරීක්ෂා කිරීම,ඇගයීම යන කටයුතු සඳහා පෙලජිකොස් පුද්ගලික සමාගම පත් කොට තිබේ. ශ්‍රී ලංකාවේ මරුවැල් පන්න ධීවර කර්මාන්තයේ දියුණුව සඳහා ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය(FIP) මගින් ජූලි මාසයේ සිට ගත් පියවරයන් මෙම පළමු පුවත් හසුන මගින් ඉදිරිපත් කෙරේ.




## ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ නව ව්‍යාපෘතිය පිළිබඳව



ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ නව ව්‍යාපෘතිය රජයේ පාලන අධිකාරීන් ,ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ ආහාර නිෂ්පාදකයින්,බෝට්ටු හිමිකරුවන්ගේ සංගමය,ධීවර යාත්‍රා නියමුවන් සහ ඔවුන්ගේ නාවික පිරිස (ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ තීරකයන්)අතර සහයෝගිතාවයෙන් සිදුවන්නකි. එම පාර්ෂවයන් අතර පළමු හමුවීම, එම්.ඩබ්.ඩබ්.ආර්.අධිකාරී(ලේකම්,ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යංශය)විසින් පසුගිය ජූලි මස අගදී සිදු කරන ලදී. මෙහිදී ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරිමේ නව ව්‍යාපෘතියෙහි තනතුරු සඳහා (පහත සඳහන්) එක් එක් පුද්ගලයන් පත්කර ගැනීම සිදුවිය. නියෝජිත මණ්ඩලයේ දෙවන හමුවීම පසුගිය ඔක්තෝම්බර් මස පැවැත්වූ අතර එහිදී නව ව්‍යාපෘතියේ අරමුණු සාකච්ජා කොට සම්මත කෙරිණි.(අනෙක් පිටුව බලන්න). මෙම හමුවේදී තවදුරටත් ශ්‍රී ලංකාවේ මරුවැල් පන්න ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා ඇති ආසන්නතම අවස්ථා (සහතිකකරණය ඇතුළත්ව)සහ අභියෝග මැඩපැවැත්වීමට ගතයුතු ක්‍රියාමාර්ග ඉදිරිපත් කිරීම සහ සාකච්ජා කිරීමද සිදුවිය.

| | |
|---|---|
| සභාපති | ඩබ්.එම්.එම්.ආර් අධිකාරි ,ලේකම්,(MFARD) |
| MFARD | සේපාලිකා වික්‍රමසිංහ,වැඩ බලන අධ්‍යක්ෂක,තත්ත්ව පාලන අංශය |
| DFAR | එච්.එල්.එන්.සඳමාලි හේරත්, සහකාර අධ්‍යක්ෂක , ධීවර කළමනාකරණ අංශය |
| NARA | ආචාර්ය සිසිර හපුතන්ත්‍රී, ප්‍රධානි , සාගර ජෛව සම්පත් කළමනාකරණ අංශය |
| CFHC | පර්සි සමරසිංහ,සාමාන්‍ය කළමනාකාර,ලංකා ධීවර වරාය සංස්ථාව |
| CFC | පී.යූ.කේ.බොතේජු, ලංකා ධීවර සංස්ථාව |
| SLEDB | මාලනී බද්දේගමගේ, කෘෂි අපනයන අධ්‍යක්ෂක, ශ්‍රීලංකා අපනයන සංවර්ධන මණ්ඩලය |
| SEASL | සභාපති, ලේකම් සහ අනෙක් සාමාජික සමාගම |
| බෝට්ටු හිමිකරුවන් | සමස්ත ලංකා බහුදින ධීවර යාත්‍රා හිමිකරුවන්ගේ සංගමයේ සාමාජිකයින් (තහවුරු කරගැනීමට නියමිත) |
| ධීවර යාත්‍ර නියමුවන් | තහවුරු කරගැනීමට නියමිත |

## ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ නව ව්‍යාපෘතියේ අරමුණු

ශ්‍රී ලංකාවේ ධීවර යාත්‍රා මගින් කරමල් දැල්, මරුවැල් පන්න,පාරම්පරික හැඹිලි දැල් , අත් යොත් පන්නය සහ දුවන පන්නය යොදා ගනිමින් අනන්‍ය ආර්ථික කලාපය(EEZ) හා අන්තර්ජාතික මුහුදු කලාපය තුළ 2016 වර්ෂයේදී ලබාගෙන ඇති මත්ස්‍ය අස්වැන්න මෙට්‍රික් ටොන් 77,029.24 වන අතර ප්‍රතිශත වශයෙන් ගත් කළ එම අස්වැන්නෙහි ටූනා මත්ස්‍යයින් 86% වූ අතර බිල් මත්ස්‍ය අස්වැන්න 14% විය(නාරා,2017). එහි ප්‍රධාන මත්ස්‍ය විශේෂ වූයේ බලයා,කෙලවල්ලා,ඇස්ගෙඩි කෙලවල්ලා,ලන්සි කෙලවල්ලා සමඟ තලපත්,සප්පරා,නිල් ,කළු සහ ඉරි කොප්පරා යන මත්ස්‍ය විශේෂයන්ය. මෙම නව ව්‍යාපෘතියෙහි අරමුණ තීරණය කරනු ලැබුවේ කරුණු 3ක් පදනම් කරගනිමිනි. එනම්,(1).ශීතකළ ටූනා සහ බිල් මත්ස්‍ය නිෂ්පාදන සඳහා පවතින අපනයන ඉල්ලුම (2).අපනයනය සඳහා ටූනා සහ බිල් මත්ස්‍යයන් සපයන ධීවර යාත්‍රා සහ පන්න වර්ග(3).ප්‍රධාන අපනයන මත්ස්‍ය විශේෂ වල වර්තමාන සහ කෙටිකාලීන තත්ත්වය.

ශ්‍රී ලංකාවේ නැවුම් සහ ශීතකළ මුහුදු ආහාර අපනයන කර්මාන්තය රඳා පවතින්නේ කෙලවල්ලන් නිෂ්පාදිතය සඳහා පවතින ඉල්ලුම මතය. ඇස්ගෙඩි කෙලවල්ලන්,තලපත්,සප්පරා සහ කොප්පරා මත්ස්‍ය නිෂ්පාදන සඳහා පවතින ඉල්ලුමද මෙම කර්මාන්තයට වැදගත්ය.

ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ට ටූනා සහ බිල් මත්ස්‍ය අස්වැන්න ලබා ගැනීමට පවතින ප්‍රධාන ප්‍රභවයන් වන්නේ පාරම්පරික(<මීටර් 15)සහ අර්ධ කාර්මික(<මීටර් 24)බහුදින ධීවර බෝට්ටු සහ කෙටි පන්න යෙදවුම්(500-1500 ඇමිණුම්) වේ. 2017 වර්ෂයේදී මරුවැල් පන්න යොදා ගන්නා බහුදින බෝට්ටු 498ක් ශ්‍රීලංකාවේ අනන්‍ය ආර්ථික කලාපයෙන් (EEZ)ඔබ්බෙහි ධීවර කටයුතු සඳහා ලියාපදිංචි වී තිබේ. ඉන් 80%ක යාත්‍රා ප්‍රමාණයක් හලාවත(තොඩුවාව හා වෙන්නප්පුව)සහ මීගමුව දිස්ත්‍රික් ධීවර කාර්යාල යටතේ ලියාපදිංචි වී ඇත. තවද මරුවැල් පන්න බහුදින බෝට්ටු 300ක ප්‍රමාණයක් අනන්‍ය ආර්ථික කලාපය(EEZ) සඳහා පමණක් ලියාපදිංචි වී ඇත.

ඉන්දියන් සාගර ටූනා කොමිසම (IOTC) විසින් සිදු කරන ලද මත්ස්‍ය තොග තක්සේරුවට අනුව (වම්පස බලන්න) ඇස්ගෙඩි කෙලවල්ලා සහ සප්පරා ධීවර කර්මාන්තය කළමනාකරණය දැනට තිරසාර ලෙස සිදු වේ(කොළ). කෙලවල්ලන් මත්ස්‍ය තොගය, ප්‍රමාණය ඉක්මවා අස්වැන්න ලබා ගෙන ඇති බව තහවුරු වන අතර තව දුරටත් ප්‍රමාණය ඉක්මවා අස්වැන්න ලබා ගැනීමට භාජනය වීමට හැකියාව ඇත. (රතු). කෙසේ හෝ ඉදිරි වසර තුන ඇතුළත තාවකාලික නිර්දේශිත ලකුණු සහ අස්වනු පාලන නීති මගින් මෙම තොග නැවත ප්‍රකෘති තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය කටයුතු සකස් කොට ඇත.

තලපත් සහ නිල් කොප්පරා මත්ස්‍ය තොගයන්ද ප්‍රමාණය ඉක්මවා අස්වැන්න ලබා ගෙන ඇති අතර තව දුරටත් ප්‍රමාණය ඉක්මවා අස්වැන්න ලබා ගැනීමට භාජනය වීමට හැකියාව ඇත (කැඹිලි). කළු සහ ඉරි කොප්පරා මත්ස්‍ය තොග, ප්‍රමාණය ඉක්මවා අස්වැන්න ලබා ගෙන ඇති බව තහවුරු වන අතර තව දුරටත් ප්‍රමාණය ඉක්මවා අස්වැන්න ලබා ගැනීමට භාජනය වීමට හැකියාව ඇත (රතු). නිර්දේශිත ලකුණු නොමැති මෙම විශේෂයන්ගෙන් පිළිඹිබු වනුයේ එම විශේෂ ඉදිරි වසර තුන තුළ අසම්භාව්‍ය ලෙස ප්‍රකෘති තත්ත්වයට පත්වීමේ ඉඩ ඇති බවයි.

| ඉලක්කගත විශේෂය ? | තොග තත්වය 2017 |
|---|---|
|  | රතු ( නිර්දේශිත ලකුණු ) |
|  | කොළ ( නිර්දේශිත ලකුණු ) |
|  | කොළ ( නිර්දේශිත ලකුණු ) |
|  | කැඹිලි (නිර්දේශිත ලකුණු නැත ) |
|  | කැඹිලි (නිර්දේශිත ලකුණු නැත ) |
|  | රතු (නිර්දේශිත ලකුණු නැත ) |
|  | රතු (නිර්දේශිත ලකුණු නැත ) |




ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අභ්‍යන්තර තක්සේරුව අනුව ව්‍යාපෘතියේ සාමාජිකයින් විසින් ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් ආවරණය කළ යුතු කරුණු මෙසේය.

| | |
|---|---|
| භූගෝලීය: | ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපය (EEZ)සහ ඉන්දියන් සාගරයේ අන්තර්ජාතික මුහුදු කලාපය |
| යාත්‍රා වර්ගය: | අනන්‍ය ආර්ථික කලාපය තුළ (EEZ)හෝ ගැඹුරු මුහුදු කලාපයේ ධීවර කටයුතු සඳහා ලියාපදිංචි වී ඇති ශ්‍රී ලංකාවේ බහුදින ධීවර බෝට්ටු (වම්පස) |
| පන්න වර්ගය: | මරුවැල් පන්න (500-1500 ඇමිණුම් ) |
| ඉලක්කගත විශේෂ: | කෙලවල්ලා,ඇස්ගෙඩි කෙලවල්ලා,සප්පරා |

## *එක් එක් ධීවර කර්මාන්තයේ ජෛව විද්‍යාත්මක තත්ත්වය වැඩිදියුණු කිරීම*



ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (DFAR) මගින් 2017 වර්ෂයේදී ලබා ගත් ශ්‍රී ලංකාවේ කෙලවල්ලන් අස්වැන්න, ඉන්දියන් සාගර ටූනා කොමිසම (IOTC) හි තීරණය17/01 (**IOTC** මගින් නිරීකෂණය කරනු ලබන ඉන්දියන් සාගරයේ ප්‍රදේශ වල කෙලවල්ලන් තොගය නැවත ගොඩ නැංවීම සඳහා සකසන ලද අන්තර් වාර සැළැස්ම )හි සඳහන් අගයට සමාන වේ .මෙම තීරණය ටූනා හෝ අනෙකුත් ටූනා වැනි මත්ස්‍ය වර්ග ඉලක්ක කරගත් IOTC මගින් නිරීකෂණය කරනු ලබන ප්‍රදේශයේ පවතින ව්‍යාපාරික ධීවර යාත්‍රා වලට සහ අනන්‍ය ආර්ථික කලාපයෙන් (EEZ)ඔබ්බෙහි වෙනත් රාජ්‍යක බලය යටතේ පවතින මුහුදු කලාපයක, ධීවර කටයුතු වල යෙදෙන සාම්ප්‍රදායික ධීවර යාත්‍රා සඳහා යෙදේ. IOTC මගින් සියලුම පාර්ශව සඳහා 2017 වර්ෂයේදී කෙලවල්ලන් අස්වනු ප්‍රමාණය අඩු කිරීමට මෙහි සඳහන් වන පරිදි යොමුකර ඇත. - හැඹිලි දැල් ධීවර කර්මාන්තය සඳහා (>මෙට්‍රික් ටොන් 5,000) 2014 වර්ෂයේ අස්වනු ප්‍රමාණයෙන් 14%; කරමල් දැල් ධීවර කර්මාන්තය සඳහා මෙට්‍රික් ටොන් 2,000ට වැඩි ප්‍රමාණයක් සහ මරුවැල් පන්න ධීවර කර්මාන්තය සඳහා (>මෙට්‍රික් ටොන් 5000)2014 අස්වනු ප්‍රමාණයෙන් 10%ක් සහ අනෙකුත් පන්න සඳහා (>මෙට්‍රික් ටොන් 5,000)2014 අස්වනු ප්‍රමාණයෙන් 5%ක ප්‍රමාණයක්. 2017 වර්ෂයේදී ශ්‍රීලංකාව, IOTC හි මග පෙන්වීම අනුව කටයුතු කොට කෙලවල්ලන් මත්ස්‍ය තොගයෙහි ජෛව විද්‍යාත්මක තත්ත්වය වැඩිදියුණු කරනු ඇති බව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විශ්වාස කරයි.



2016 වර්ෂයේ ලබා ගත් බර ප්‍රමාණ අනුව, ඇස්ගෙඩි කෙලවල්ලන් තොගයෙන්, ප්‍රමාණය ඉක්මවා අස්වනු නෙලීමක් සිදු නොකොට ඇති බවත් එවැනි තත්ත්වයකට පත්වීමේ හැකියාවක් නොමැති බවත් IOTC වාර්තාව මගින් ස්ථිර කොට ගෙන තිබේ. IOTC හි කළමනාකරණ උපදෙස් අනුව "තොග තත්ත්වය නිර්ණය කිරීමේදී එහි ගුණාත්මක බව 2016 වර්ෂයේ වෙනසකට භාජනය වී නැති නමුත් යම් ප්‍රමාණයකට 2013 වර්ෂයට වඩා ශුභවාදීබවෙන් අඩුය. නමුත් අස්වනු ප්‍රමාණය, දැනට පවතින ධීවර කර්මාන්තයන් සඳහා තක්සේරු කරන ලද ඉහළම තිරසාර ඵලදාවට වඩා අඩුනම් ඉක්මන් කළමනාකරණ උපායමාර්ග අවශ්‍ය නොවේ.”



2016 වර්ෂයේ ලබා ගත් බර ප්‍රමාණ අනුව, සප්පරා මත්ස්‍ය තොග, ප්‍රමාණය ඉක්මවා අස්වනු නෙලිමකට ලක් වී නැති අතර එවැනි තත්ත්වයකට ලක් වීමක් දක්නට නැති බව IOTC වාර්තා මගින් ස්ථිර කොට තිබේ. IOTC හි කළමනාකරණ උපදෙස් මෙලෙස නිශ්චය කොට තිබේ. “ඉතා මෑතකදී ලබාගත් අස්වැන්න(2015 වර්ෂයේදී ටොන් 41,760) වන අතර එය ඉහළම තිරසාර ඵලදා මට්ටමට (ටොන් 39.400)වඩා ටොන් 2,360 කින් වැඩි ප්‍රමාණයකි.එබැවින් 2017 වර්ෂයේ ලබා ගන්නා මත්ස්‍ය අස්වැන්න ඉහළම තිරසාර මට්ටමට වඩා අඩු විය යුතුය(ටොන් 39.400).2017 වර්ෂයේ යාවත්කාලීන කරන ලද තොග තක්සේරුවට අනුව බෙහෙවින් යෝග්‍ය විසඳුමක් 2018 වර්ෂයෙන් පසුව සංවර්ධනය විය යුතුය.”

## *මරුවැල් පන්න ධීවර කර්මාන්තයේ පාරිසරික තත්ත්වය වැඩිදියුණු කිරීම*

ශ්‍රී ලංකාවේ බහුදින *ධීවර* යාත්‍රා අනන්‍ය ආර්ථික කලාපය (EEZ) තුළ සහ ඉන් ඔබ්බෙහි කරමල් දැල් , මරුවැල් පන්න,පාරම්පරික හැඹිලි දැල් , අත් යොත් පන්නය සහ දුවන පන්නය භාවිතා කොට කෙලවල්ලන් සහ සප්පරා මත්ස්‍ය අස්වනු ලබා ගනී.එක් එක් ආම්පන්න වර්ග වලින් ඉලක්කගත නොවන විශේෂ සඳහා විවිධ පාරිසරික බලපෑම් ඇතිවේ.ඉලක්කගත නොවන විශේෂ කෙරෙහි ආම්පන්න වල බලපෑම ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපය තුළ (EEZ) සහ ඉන් ඔබ්බෙහිදී විවිධ විය හැක. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ, ධීවර කළමනාකරණ ඒකකය සහ ගැඹුරු මුහුදු කලාපයේ මසුන් ඇල්ලීම පිළිබඳ වූ ඒකකය විසින් අනන්‍ය ආර්ථික කලාපය(EEZ) හා ඉන් ඔබ්බෙහි මත්ස්‍ය අස්වැන්නෙන් , මරුවැල් පන්න ක්‍රමය මගින් පමණක් ලබා ගත් මත්ස්‍ය අස්වැන්නේ දත්ත වෙන් කිරීමට කටයුතු ආරම්භ කරන ලදි.ශ්‍රී ලංකාවේ මරුවැල් පන්න ධීවර කර්මාන්තය තුළින් ඉලක්කගත නොවන විශේෂ සඳහා වන බලපෑම් පිළිබඳ දළ වාර්තාව ඊළඟ වර්ෂයේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් ප්‍රසිද්ධියට පත් කරනු ඇත.

## *මරුවැල් පන්න ධීවර කර්මාන්තය සඳහා කළමනාකරණ කටයුතු වැඩිදියුණු කිරීම*



ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මගින් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ව්‍යාපාරික ධීවර යාත්‍රා හතරෙහි (>මීටර් 24 LoA )සියලු මසුන් ඇල්ලීමේ ගමන් සඳහා විද්‍යාත්මක නිරීක්ෂකයන් යෙදවීමේ කටයුත්ත සහ අර්ධ කාර්මික හා පාරම්පරික මරුවැල් පන්න ධීවර යාත්‍රා (<මීටර් 24)සඳහා විද්‍යුත් නිරීක්ෂක ක්‍රමයක් හඳුන්වාදීමේ කටයුත්ත ස්වේච්චාවෙන් පවර ගන්නා ලදි. මේ අරමුණ ඉටු කර ගැනීම සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට, නව විද්‍යාත්මක නිරීක්ෂකයන් හැඩගැස්වීමේ වැඩසටහනට සම-මූල්‍යකරණයෙන් ,ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය(FIP) සහාය වූ අතර , (නොවැම්බර් මස,දකුණු පස) දින තුනක තාක්ෂණික පුහුණුව ලබා දීමේ වැඩසටහනක් IOTC හි කාර්යමණ්ඩලය මගින් පැවැත්වූ අතර එම වැඩසටහනෙහි IOTC හි විද්‍යුත් වාර්තාකරණය වැඩසටහන පිළිබඳ හැඳින්වීමක්ද ඇතුළත් විය. ඊළඟ වර්ෂයේ ජනවාරි මස එක්සත් ජාතීන්ගේ(FAO)ආයතනය මගින් තාක්ෂණික නිරීක්ෂකයන් සඳහා පැවැත්වෙන සති දෙකක පුහුණු වැඩසටහනකට අනුග්‍රහය ලබා දීමට කටයුතු යොදා ඇති අතර එම වැඩසටහන පවත්වනු ලබන්නේ කැප් මැරීන් ආයතනය මගිනි. වාර්තාකරණ කාලසීමාව තුළදී ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ වැඩසටහනෙහි සාමාජිකයන් ස්පාඤ්ඤයේ (සැප්තැම්බර්)සහ සීෂෙල්ස් හි(ඔක්තෝම්බර්,නොවැම්බර් සහ දෙසැම්බර්) පැවති IOTC හි ධීවර කළමනාකරණ වැඩමුළුවකට සහභාගි විය.

## සමාජීය වගකීම සහ ආර්ථික සාධාරණය වැඩිදියුණු කිරීම

ශ්‍රී ලංකාවේ මරුවැල් පන්න ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ නව ව්‍යාපෘතියෙහි සාමාජිකයින් විසින් ටූනා සහ සප්පරා නිෂ්පාදිත සඳහා වූ සම්පූර්ණ සැපයුම් දාමය තුළ, සමාජීය වගකීම සඳහා වූ ඉහළම අන්තර්ජාතික ප්‍රමිතීන්ට අදාළව කටයුතු කිරීමට කැප විය.ළමා කම්කරුවන්,සංක්‍රමණික කම්කරුවන්,අනියම් කම්කරුවන්,ශ්‍රී ලංකාවේ ටූනා සහ සප්පරා නිෂ්පාදිතයන් සැකසීම උදෙසා අවශ්‍ය අස්වනු නෙළීමට,සැපයීමට හෝ නිෂ්පාදනයට දැනට පවත්නා ක්‍රමයෙහි යොදා නොගත් අතර අනාගතයේදීද එම තත්ත්වය එලෙසින්ම පවතිනු ඇත.සැපයුම් දාමය පුරාම සමාජීය වගකීම උදෙසා වූ ඉහළම ප්‍රමිතීන් සුරක්ෂිත කිරීම හා ආර්ථික සාධාරණත්වය වැඩිදියුණු කිරීම,තිරසාර ලෙස කළමනාකරණය කරනු ලබන මරුවැල් පන්න ධීවර කර්මාන්තය වැනි කුඩා පරිමාණයේ ධීවර කටයුතු සඳහා අත්‍යවශ්‍ය අංගයකි.තිරසාර ලෙස ලබාගත් මුහුදු ආහාර නිෂ්පාදන මගින් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ සාධාරණ ලෙස ධීවර ප්‍රජාව උදෙසා බෙදී නොගියහොත් ,සියයක් පමණ වූ කුඩා බෝට්ටු හිමියන්ට සහ දහසක් පමණ වූ ධීවරයන්ට තිරසාර ලෙස මෙම සම්පත් ලබා ගැනීමට දිරිදීමනා ලැබෙන්නේ කෙලෙසද?



නව ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ වැඩසටහන පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා හමුවීමක් දික්ඕවිට ධීවර වරායේදී ,සමස්ත ලංකා බහුදින ධීවර බෝට්ටු හිමිකරුවන්ගේ සංගමයේ සභාපති සහ සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වීමට ලංකා ධීවර වරාය සංස්ථාව(CFHC), ඔක්තෝම්බර් මස කටයුතු සංවිධානය කර තිබිණි.මෙමගින් ශ්‍රී ලංකාවේ බහුදින මරුවැල් පන්න ධීවර කටයුතු සඳහා ප්‍රධාන මධ්‍යස්ථාන වන මීගමුව,තොඩුවාව හා වෙන්නප්පුව(දකුණු පස බලන්න) ප්‍රදේශ වල බෝට්ටු හිමිකරුවන්ගේ සංගම් වල සාමාජිකයින්අතර හමුවක් සඳහා අවස්ථාව සැලසිණි.ජාතික හා ප්‍රාදේශීය ධීවර යාත්‍රා හිමිකරුවන්ගේ නියෝජිතයන් සහ ධීවර යාත්‍රා නියමුවන්ගේ සංගම් ,ඊළඟ වර්ෂයේ නව ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි සාමාජිකයන් බවට පත් වනු ඇත.

## *ශ්‍රී ලංකා ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය /ධීවර කටයුතු පිළිබඳ තත්ත්ව වාර්තාව*

*සෑම මාස හයකට වරක්ම ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් සෑම මරුවැල් පන්න ධීවර කටයුත්තකටම අදාළව අභ්‍යන්තර කාර්යසාධන ඇගයීමක්, ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ අන්තර්ජාතික විධි / මුහුදු අහාර තිරසාර ලෙස ලබා ගැනීම, යන කරුණු වලට අනුව සිදු කරයි.මෙහි ප්‍රථම අභ්‍යන්තර කාර්යසාධන ඇගයීම මගින් පහත අදහස් ඉදිරිපත් වී ඇත.*

ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මේ වන විටත් SFP 4 (ඇතිවන බලපෑම) / 5 වන අවධිය (ඇතිවන ප්‍රථිපල) යන අවධියෙහි පවතී. ජාතික ධීවර ප්‍රතිපත්ති වෙනස් වී ඇති අතර කෙලවල්ලන් තොගය වැඩිකිරීමට ප්‍රයත්නයන් සිදු කෙරෙමින් පවතී.;

කෙලවල්ලන් ධීවර කර්මාන්තය MSC හි ධීවර ප්‍රමිතීන්ට එරෙහිව **0.64** ක ලකුණු ලබා ගත යුතුය. (ඉලක්කය ≥ 0.60)
ඇස්ගෙඩි කෙලවල්ලන් ධීවර කර්මාන්තය MSC හි ධීවර ප්‍රමිතීන්ට එරෙහිව **0.65** ක ලකුණු ලබා ගත යුතුය. (ඉලක්කය ≥ 0.60)
සප්පරා ධීවර කර්මාන්තය MSC හි ධීවර ප්‍රමිතීන්ට එරෙහිව **0.65** ක ලකුණු ලබා ගත යුතුය. (ඉලක්කය ≥ 0.60)

කෙලවල්ලන් ධීවර කර්මාන්තය, SW හි නිර්ණායක වලට එරෙහිව **1.40** ක ලකුණු ලබාගත යුතුය (ඉලක්කය ≥ 2.20)
ඇස්ගෙඩි කෙලවල්ලන් ධීවර කර්මාන්තය, SW හි නිර්ණායක වලට එරෙහිව **2.10** ක ලකුණු ලබාගත යුතුය (ඉලක්කය ≥ 2.20)
සප්පරා ධීවර කර්මාන්තය, SW හි නිර්ණායක වලට එරෙහිව **2.10** ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය (ඉලක්කය ≥ 2.20)

දෙසැම්බර් මාසයේදී SEASL ආයතනය මගින් MSC සමග ගිවිසුමක් අත්සන් කල අතර ඊට අදාළව අනුමැතිය ලත් උපදේශකයෙකු සමග MSC හි ධීවර ප්‍රමිතීන්ට එරෙහිව ශ්‍රී ලංකාවේ මරුවැල් පන්න ක්‍රමය යොදා ගෙන සිදු කරන කෙලවල්ලන්,ඇස්ගෙඩි කෙලවල්ලන්,සප්පරා ධීවර කටයුතු පිළිබඳව ස්වාධීන තක්සේරුවක් කිරීමට කටයුතු යොදා ඇත.2018 ජනවාරි මස අවසන් වන විට තක්සේරු කිරීමේ ප්‍රථිඵල අපේක්ෂා කෙරේ.

ඔක්තෝම්බර් මාසයේදී ග්ලෝබල් සීෆුඩ් ප්‍රයිවට් ලිමිටඩ්,ජේ සීෆුඩ් ප්‍රයිවට් ලිමිටඩ්,තැප්‍රෝබේන් සීෆුඩ් ගෘප් ප්‍රයිවට් ලිමිටඩ් සහ ට්‍රෝපික් ෆ්රෝසන් ෆුඩ්ස් ප්‍රයිවට් ලිමිටඩ් යන සමාගම් ධීවර කර්මාන්තය වැඩිදියුණු කිරීමේ නව ව්‍යාපෘතියෙහි නව සංස්ථාපිත සාමාජිකයන් බවට පත්විය. මෙම ව්‍යාපෘතියෙහි සාමාජිකයින් නිව් ඉන්ග්ලන්ඩ් සීෆුඩ් ඉන්ටර්නැෂනල් සමාගමට, MSC හි පූර්ව ඇගයීම සිදු කිරීමට සහ-මූල්‍යකරණයෙන් දායකවීම පිළිබඳව කෘතඥතාව පළ කරනු ලැබේ.

Soft copies of this edtion of the Sri Lankan Longline FIP Bulletin are available in English, Sinhala and Tamil.
To request a copy please email steve@pelagikos.lk